# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුභූරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1492 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 20/09/2024
පැය 1550

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - මීගමුව පොලිස් වසම.

2024.09.20 වන අද දින අළුයම් කාලයේ මීගමුව පොලිස් වසමේ කොළඹ - මීගමුව ප්‍රධාන මාර්ගයේ 18 කණුව ප්‍රදේශයේදී කොළඹ දෙස මීගමුව දෙසට ධාවනය වූ ත්‍රිරෝද රථයක් කැනඩා මිත්‍රත්ව මාර්ගයට හැරෙන හන්දිය අසලදී ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි ලොරි රථයක ගැටි අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රිරෝද රථයේ රියදුරු ඇතුළු සිව්දෙනෙකු තුවාල ලබා මීගමුව රෝහලට ඇතුලත් කිරිමෙන් පිටුපස ගමන් ගත් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 67 ක් වූ හන්තාන, මහනුවර ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෘතශරිරය මීගමුව රෝහලේ මාතශරිරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදු කිරිමෙන් පසු රියදුරු පළාගොස් ඇති අතර රිය සහයක අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගෙන ඇත. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. බඹර ප්‍රහාරයක් හේතුවෙන් ගසකින් වැටි පුද්ගලයෙකු මියයාම - තලවකැලේ පොලිස් වසම.

2024.09.20 වන අද දින උදෑසන කාලයේ තලවකැලේ පොලිස් වසමේ වඩිගමලේ වත්ත ප්‍රදේශයේදී දර කැඩිමට ගොස් සිටි පුද්ගලයින් දෙදෙනකුගෙන් එක් අයෙකු ගසක නැග දර කපමින් සිටියදි දෙදෙනාම බඹර ප්‍රහාරයකට ලක් ව ඇති අතර ගසේ සිටි පුද්ගලයා ඉන් ඇද වැටිම හේතුවෙන් මියගොස් ඇති බවට තලවකැලේ පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ මැද කුඹුරවත්ත, වටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනෙක් පුද්ගලයා බඹරු ඇනීම හේතුවෙන් තුවාල ලබා මැටිකුඹුර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටි. මෘත ශරීරය මැටිකුඹුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තලවකැලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**